සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2020 ජනවාරි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2020-01-18
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.
(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

පොදු අරමුණු සඳහා වූ මූල්‍ය වාර්තාකරණයේ අරමුණ වන්නේ දැනට සිටින සහ අනාගත ඇල්මැති පාර්ශවයන් වෙත වාර්තාකරණ අස්තිත්වය පිළිබඳව ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු තීරණ ගැනීම සඳහා සැපයීම වේ. මූල්‍ය තොරතුරු ප්‍රයෝජනවත් වීමට නම් එම තොරතුරු විශ්වසනීය නියෝජනය සහ අදාල (relevant and faithful representation) බැවින් යුක්ත විය යුතුය. ඊට අමතරව මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා ගුණාත්මක ලක්ෂණ හතරක් තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩිදියුණු කිරීමට ඉවහල් වන ගුණාත්මක ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න.**
(ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

සංවිධානවලට සංයුක්ත වටිනාකම හා තිරසාරත්වය ඇතිකිරීමේ ක්‍රියාවලියක් ලෙස බහුලව සංකලිත වාර්තාකරණය (integrated reporting) හඳුනාගෙන තිබේ. සංවිධානමය විශ්ලේෂණය සහ බාහිර පරිසරය, සංකලිත වාර්තාවක එක් සංරචකයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංකලිත වාර්තාකරණයේ ප්‍රධාන අරමුණු (key objectives) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) සංවිධානමය විශ්ලේෂණය සහ බාහිර පරිසරයේ ඇතුළත්ව ඇති ප්‍රධාන ක්ෂෙත්‍ර (key areas) තුනක්(03) **සඳහන් කරන්න.**
(ලකුණු 03)
(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් ලද අයභාරය යටතේ අස්තිත්වයක් අයභාරය හඳුනා ගැනීමේදී පියවරයන් පහක් අනුගමනය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 ට අනුව අයභාරය හඳුනා ගැනීමේදී අනුගමනය කළ යුතු පියවර පහ(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

පහත සඳහන් ශේෂයන් **සීමාසහිත අමින් පොදු සමාගමේ** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී:

| මාර්තු 31 දිනට | 2019 (රු.'000) | 2018 (රු.'000) |
|---|---|---|
| ජංගම නොවන වත්කම්: | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 58,500 | 57,500 |
| සමුච්චිත ක්ෂය | (34,800) | (28,200) |
| **ධාරණ අගය** | **23,700** | **29,300** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සමාගම, 2019 ජනවාරි 01 දින මෝටර් රථයක් විකුණූ අතර, පිරිවැය සහ විකුණූ දිනට එහි සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.4,500,000/- ක් සහ රු.2,800,000/- ක් විය. මෝටර් රථය විකිණීමෙන් ලැබූ අලාභය රු.475,000/- කි. විකුණූ මෝටර් රථය වෙනුවට සමාගම විසින් නව මෝටර් රථයක් රු.3,000,000/- කට 2019 මාර්තු 31 දින අත්පත් කරගන්නා ලදී.

(2) දේපළ, පිරියත සහ උපකරණවල ඇතුළත් කාර්යාල ගෘහ භාණ්ඩ 2019 මාර්තු 31 දින අත්පත් කරගන්නා ලදී.

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත අමින් පොදු සමාගමේ** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත මෙඩිටෙක් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31, 2018 මාර්තු 31 සහ 2017 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂයන් සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| **දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2019 මාර්තු 31** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
|---|---|---|---|
| පිරිවැටුම | 300,000 | 275,000 | 260,000 |
| විකුණුම් පිරිවැය | 179,960 | 178,425 | 169,450 |
| දළ ලාභය | 120,040 | 96,575 | 90,550 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 43,400 | 38,300 | 41,250 |
| බදු පෙර ලාභය | 38,000 | 35,700 | 34,300 |
| බදු පසු ලාභය | 27,500 | 28,300 | 27,800 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| **දිනට** | **2019 මාර්තු 31** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
|---|---|---|---|
| **ජංගම වත්කම්:** | | | |
| තොග | 19,000 | 15,000 | 14,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 40,500 | 27,000 | 21,500 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 8,500 | 6,200 | 7,400 |
| | **68,000** | **48,200** | **42,900** |
| **ස්කන්ධය:** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 110,000 | 110,000 | 110,000 |
| රඳවාගත් ඉපැයීම් | 60,000 | 32,500 | 4,200 |
| | **170,000** | **142,500** | **114,200** |
| දිගු කාලීන ණය | 42,000 | 56,000 | 38,000 |
| **ජංගම වගකීම්:** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 19,500 | 16,200 | 15,300 |
| ගෙවිය යුතු ආදායම් බදු | 9,500 | 9,100 | 7,600 |
| උපචිත වියදම් | 8,500 | 6,100 | 6,800 |
| | **37,500** | **31,400** | **29,700** |

සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් අනුපාත ගණනය කරමින්, 2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂ සඳහා **සීමාසහිත මෙඩිටෙක් (පෞද්ගලික) සමාගමේ** කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න**:

(a) දළ ලාභ අනුපාතය.

(b) ශුද්ධ ලාභ අනුපාතය.

(c) තොග පිරිවැටුම් අනුපාතය.

(d) ණයගැති එකතුකිරීමේ කාලය.

(e) යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ [Return on Capital Employed (ROCE)] අනුපාතය. (ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සීමාසහිත වෙස් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනට සහ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ:

**සීමාසහිත වෙස් (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| **මාර්තු 31 දිනට** | **2019** | **2018** |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 23,820 | 22,420 |
| සමුච්චිත ක්ෂයවීම් | (10,590) | (9,470) |
| **ධාරණ අගය** | **13,230** | **12,950** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 320 | 470 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 1,702 | 1,270 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 398 | 210 |
| | **2,420** | **1,950** |
| **මුළු වත්කම්** | **15,650** | **14,900** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 12,200 | 12,200 |
| රඳවාගත් ඉපැයීම් | 1,260 | 660 |
| | **13,460** | **12,860** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 450 | 1,000 |
| | **450** | **1,000** |
| **ජංගම වගකීම්:** | | |
| කෙටිකාලීන ණය | 150 | 150 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,470 | 540 |
| ණය මත ගෙවිය යුතු පොලී | - | 50 |
| ගෙවිය යුතු ආදායම් බදු | 120 | 300 |
| | **1,740** | **1,040** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **15,650** | **14,900** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ආදායම් බදු වියදම රු.175,000/- කි.

(2) 2019 මාර්තු 31 දින සමාගම යන්ත්‍රයක් රු.2,000,000/- කට විකුණන ලදී. යන්ත්‍රයේ පිරිවැය රු.1,900,000/- ක් වූ අතර, 2019 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය රු.850,000/- ක් විය.

(3) වර්ෂය තුලදී, සමාගම විසින් එහි සාමාන්‍ය කොටස් හිමියන් සඳහා අතුරු ලාභාංශ වශයෙන් රු.300,000/- ක් ගෙවන ලදී.

(4) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය මත පොලී වියදම රු.325,000/- කි.

(5) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත වෙස් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(A) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සිදුවූ පහත සඳහන් සිදුවීම් **සීමාසහිත ගිත්මි සමාගමේ** මූල්‍ය කළමනාකරු සොයාගෙන තිබේ:

(a) 2018 අප්‍රේල් 01 දින සිට **සීමාසහිත ගිත්මි සමාගම** විසින් නව SAP B1 නම් නව ගිණුම්කරණ මෘදුකාංගයක් හඳුන්වා දුන් අතර, එදින සිට සමාගමේ තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කර තිබේ. 2018 මාර්තු 31 දින දක්වා තොග වටිනාකම් ගණනය කරනු ලැබුයේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ (FIFO) ක්‍රමය යටතේ වන අතර, නව ගිණුම්කරණ පද්ධතිය අනුව තොග අගය කිරීම බරතැබූ සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට ගණනය කළ යුතු විය. තොග ගණනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම හේතුවෙන් 2018 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවති තොග වටිනාකමට වඩා තොග රු. මිලියන 6.7 කින් අධිගණනය වී තිබුණි.

(b) 2017 දෙසැම්බර් 31 දින අත්පත් කරගනු ලැබූ රු.500,000/- ක් වටිනා කාර්යාල උපකරණවලට අදාලව පසුගිය මූල්‍ය වර්ෂයේ (2017/18) ක්ෂය වීම ගිණුම් තැබීමට **සීමාසහිත ගිත්මි සමාගමේ** සහකාර ගණකාධිවරයා අසමත් වී තිබේ. සමාගම විසින් කාර්යාල උපකරණ, සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැයට ක්ෂය කරන අතර, කාර්යාල උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 8 (LKAS 8) ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතය අනුව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ගිත්මි සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලට ඉහත සඳහන් සිදුවීම් දෙකෙහි බලපෑම **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(B) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ගිත්මි සමාගමට** අදාලව පහත සඳහන් තොරතුරු ද සපයා ඇත:

(a) 2017/18 තක්සේරු වර්ෂය සඳහා සමාගම විසින් ආනයනයේදී ගෙවනු ලැබූ යෙදවුම් බද්දෙන් රු. මිලියන 1.5 ක් ඉඩ නොදෙමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතුකළ අගය මත බද්ද [Value Added Tax (VAT)] සඳහා තක්සේරුවක් එවා තිබේ. මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා බොහොමයක් පැවති අතර, රු. මිලියන 1 ක් ඉඩ නොදීමේ අවසන් තීරණය 2019 අප්‍රේල් 02 වන දින ලැබී තිබුණි. මෙය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(b) **සීමාසහිත ගිත්මි සමාගම** විසින් පළ කරන ලද වෙළෙඳ දැන්වීමක් මගින් තරඟකරුවෙකුගේ නිෂ්පාදිතයකට අපහාස වූ බව සඳහන් කරමින් සමාගමේ තරඟකරුවෙක් විසින් සමාගමට විරුද්ධව නඩුවක් පවරා තිබේ. ඉල්ලා ඇති වන්දි මුදල රු. මිලියන 50 ක් වන අතර, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමේ දිනය දක්වා (එනම් 2019 මැයි 15) සමාගම වෙත මේ සම්බන්ධයෙන් වගකීමක් නොමැති බව සමාගමේ නීතිඥයන් විසින් උපදෙස් දී තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 37 (LKAS 37) ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් ප්‍රමිතියට අනුව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත සඳහන් එක් එක් අවස්ථාව හඳුනාගන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත මෙඩ්ටෝ පොදු සමාගමේ,** 2019 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත මෙඩ්ටෝ පොදු සමාගම**

**2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 900,000) | | 90,000 |
| 2018 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 17,000 |
| **දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට):** | | |
| ඉඩම | 55,000 | |
| ගොඩනැගිලි | 32,000 | |
| පිරියත සහ යන්ත්‍ර | 14,000 | |
| මෝටර් වාහන | 10,000 | |
| කාර්යාල උපකරණ | 7,200 | |
| ප්‍රාග්ධන - නොනිමි වැඩ | 16,000 | |
| **2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිලි | | 15,000 |
| පිරියත සහ යන්ත්‍ර | | 6,000 |
| මෝටර් වාහන | | 5,500 |
| කාර්යාල උපකරණ | | 3,500 |
| ඉදිරියට කළ ගෙවීම් | 1,500 | |
| **සීමාසහිත මෙඩ් රිසර්ච් සමාගමට** කළ ගෙවීම් | 2,500 | |
| 2019 මාර්තු 31 දිනට තොගය | 32,500 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 41,000 | 36,850 |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 20,500 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 16,500 | |
| ගෙවූ ආදායම් බදු | 2,750 | |
| ගෙවූ අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස් | 9,000 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 269,400 | 378,500 |
| පරිපාලන වියදම් | 46,000 | |
| බෙදාහැරීමේ වියදම් | 29,500 | |
| මූල්‍ය වියදම් | 500 | |
| 2018 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 500 |
| බැංකු ණය | | 12,000 |
| | **585,350** | **585,350** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට පැවති තොගයේ හානියට පත් වූ රු.700,000/- ක පිරිවැය වූ තොගයක් ඇතුලත් වේ. මෙම තොගය රු.250,000/- කට ගැනුම්කරුවෙකුට 2019 අප්‍රේල් 05 දින විකුණූ අතර, සමාගම විසින් ගැනුම්කරුගේ ගබඩාව වෙත මෙම තොගය ප්‍රවාහනය කිරීමට, ප්‍රවාහන ගාස්තු ලෙස රු.20,000/- ක පිරිවැයක් දැරීමට සිදුවිය. මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් සිදුකර නොමැත.

(2) 2019 මාර්තු 01 දින සමාගම විසින් එහි ඉඩම රු. මිලියන 60 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙය ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

(3) 2018 ජූලි 01 දින, සමාගම විසින් නව යන්ත්‍රයක් අත්පත් කරගත් අතර, මිලදී ගැනීමේ පිරිවැය වූ රු.3,500,000/- ගැනුම් ගිණුමේ සටහන් කර තිබේ. ඊට අමතරව, එදිනම එම යන්ත්‍රය සවිකිරීම සහ පරීක්ෂා කිරීම සඳහා රු.500,000/- පිරිවැයක් දරනු ලැබූ අතර, එය පරිපාලන වියදම් යටතේ වාර්තාකොට තිබේ.

(4) වර්ෂය තුළදී සමාගම විසින් නව නිෂ්පාදිතයක් සඳහා පර්යේෂණයක් කළ අතර, ඒ සඳහා රු.2,500,000/- ක් **සීමාසහිත මෙඩ් රිසර්ච් සමාගමට** ගෙවන ලදී. මෙය **සීමාසහිත මෙඩ් රිසර්ච් සමාගමට** කළ ගෙවීම් ගිණුමට හර කර ඇත. සමාගම විසින් නව නිෂ්පාදිතයේ වාණිජ මෙහෙයුම් 2019 අප්‍රේල් මස ආරම්භ කරන ලදී.

(5) නව කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සමාගම විසින් 12% වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 12 ක බැංකු ණයක් 2019 ජනවාරි 01 දින ලබාගන්නා ලදී. තවද මෙම ණය මුදල සඳහා ප්‍රාග්ධන ගෙවීම් (capital repayments) කිසිවක් මෙම වර්ෂය තුළ සිදුකර නොමැති අතර, ණය මුදල මත වර්ෂයට අදාල පොලිය මූල්‍ය වියදම් යටතේ ගිණුම්ගත කර තිබේ. 2019/20 වර්ෂය තුළදී ණයමුදලෙන් ½ ක් පියවිය යුතුවේ. 2019 ජනවාරි 01 දින කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කළ අතර, 2020 සැප්තැම්බර් 30 දිනට ඉදිකිරීම් අවසන් කිරීමට බලාපොරොත්තු වේ. ඉදිකිරීම් සඳහා දරණ ලද පිරිවැය ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුම යටතේ වාර්තා කර තිබේ.

(6) දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීව කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 20 |
| පිරියත සහ යන්ත්‍ර | : | වර්ෂ 10 |
| මෝටර් වාහන | : | වර්ෂ 05 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 10 |

(7) 2018/19 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ආදායම් බදු වගකීම රු.2,950,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(8) රු. මිලියන 2 ක් අයවිය යුතුව තිබූ ගනුදෙනුකරුවෙකු ආගිය අතක් නොමැති බවට 2019 මාර්තු 31 දින දැන ගැනීමට ලැබුණි. තවද ඔහුගෙන් එම ණය මුදල අයකර ගැනීමට නොහැකි බැවින් එය නැවත අයකරගත නොහැකි තත්ත්වයට පත්ව තිබේ. තවදුරටත් 2019 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය සඳහා 2% පොදු වෙන්කිරීමක් සිදුකළ යුතුව ඇත.

(9) 2019 මාර්තු මාසයට අදාල විදුලි බිල වූ රු.700,000/- ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(10) 2019 මැයි 02 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2019 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු.5/- බැගින් වූ අවසාන ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

(11) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ජූනි 20 දින මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

ඉහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත මෙඩිටෝ පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 07)

(c) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 04)

(d) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගමේ** සහ **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් පහත පරිදි වේ:

**2019 මාර්තු 31 දිනට**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගම** | **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගම** |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 52,000 | 23,500 |
| සමුච්චිත ක්ෂය | (12,500) | (7,500) |
| ධාරණ අගය | **39,500** | **16,000** |
| **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමේ** ආයෝජනය | 40,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 13,100 | 27,900 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 40,250 | 10,500 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,300 | 1,100 |
| | **55,650** | **39,500** |
| **මුළු වත්කම්** | **135,150** | **55,500** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 80,000 | 35,000 |
| රඳවාගත් ඉපැයීම් | 13,300 | 8,150 |
| | **93,300** | **43,150** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 16,200 | - |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 20,250 | 11,400 |
| කෙටිකාලීන ණය | 5,400 | 950 |
| | **25,650** | **12,350** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **135,150** | **55,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 අප්‍රේල් 01 දින, **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගම** විසින් **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් අත්පත් කරගන්නා ලදී.

(2) අත්පත් කරගත් දිනට පාලනය නොවන හිමිකමේ සාධාරණ වටිනාකම රු. මිලියන 7.72 කි. අත්පත් කරගත් දිනට **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමේ** රඳවාගත් ඉපැයීම් රු. මිලියන 6 ක් වූ අතර, සමාගමේ හඳුනාගත හැකි වත්කම්වල සාධාරණ අගය ඒවායේ පොත් අගයට සමාන විය.

(3) 2019 මාර්තු 31 දින, **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමේ** තොගයෙහි, **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගමෙන්** මිලදී ගත් රු. මිලියන 4.5 ක් වටිනා තොග පැවතුණි. **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගම** විසින් **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමට** පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ විකුණා තිබේ. තවද, **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගමට** ගෙවිය යුතු **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමේ,** රු. මිලියන 2.5 ක වෙළෙඳ ගෙවිය යුතු ශේෂයක් තිබේ.

(4) 2018 අප්‍රේල් 01 දින **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගම** විසින් රු. මිලියන 4 ක කෙටිකාලීන ණයක් 15% ක වාර්ෂික පොලියකට **සීමාසහිත ශක්ති (පෞද්ගලික) සමාගමෙන්** ලබාගන්නා ලදී. **සීමාසහිත ගජශක්ති (පෞද්ගලික) සමාගම,** මෙම වර්ෂය තුළ ප්‍රාග්ධනය ආපසු ගෙවීම සිදු නොකළ නමුත් ණය මුදල මත පොලිය වර්ෂය තුළදී ගෙවන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවන කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) 2019 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 14)

(B) 2019 මාර්තු 31 දිනෙන් සහ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා පහත සඳහන් අනුපාතයන් **සීමාසහිත වක්කුඹුර හෝල්ඩිංග්ස් පොදු සමාගම** විසින් ගණනය කර තිබේ:

| | **2018/19** | **2017/18** |
|---|---|---|
| ජංගම අනුපාතය | 1.75 | 1.5 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ROCE) | 11% | 13% |
| තොග රඳවා ගැනීමේ කාලය | දින 50 | දින 38 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017/18 වර්ෂය සමඟ සසඳා බැලීමේදී ඉහත දැක්වෙන එක් එක් අනුපාතයන් 2018/19 දී වෙනස්වීමට තුඩුදෙනු ඇතැයි සිතිය හැකි හේතු දෙක(02) බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාළ කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |